සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය - 2021
கண்டுபிடிப்பு சோதனை - 2021
Diagnostic Test - 2021

**සිංහල 1** **71 – 1** **13 ශ්‍රේණිය**

පැය තුනයි අමතර කියවීම කාලය- මිනිත්තු 10 යි.

අමතර කියවීම කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස්**

*__පළමු__ ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙනෙ (අ), (ආ), (ඉ), (ඊ) හා (උ), උද්ධෘත අතරින් සතරක් තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා ( එ ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. ( මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න. )

(අ ) ඒ අසා දෙවතාණෝ 'මෙ තැනට අවුත් මා මෙතෙක් කථා කොටත් බමුණාණෝ තුනුරුවන් පැහැද පින් කොට නොයෙත් නම්, කළ පිට වට වැස්සෙන් කළය ඇතුළට ප්‍රයොජන නැත්තා සේ මාගේ කථාවෙන්මුත් ප්‍රයෝජන නැත. කරන මේ කතාවෙන් මුන් ඇතුළු වූ සියල්ලන් සිත පහදවා ගත් පමණිකින් දෙව් ලොව සැපත් සිද්ධ කරන ලෙසට කියමි' සිතා බමුණානෙනි, තෙප කීවා සේ වැඩිමාලුව සිටි තොපගෙන් එ ලෙස විධානයකුත් නැති හෙයින් දානාදී වූ පින්කමක් කට නුහුණුම්හ. එතෙකුදු වුවත් අහේතුක ප්‍රතිසන්ධික වූ බකමූණන් පවා සර්වඥ ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ කෙරෙහි සිත් පහදවා ගත් පමණිකින් කල්ප ලක්ෂයක් දුගතියට නො ගොස් කෙළවර සොමනස්ස නම් පසේ බුදු වන කල ඒ චිත්ත ප්‍රසාදය අපට කැල ම පිහිට වන්නේ වේ දැයි මියන ආසන්න පිල් කඩ හොත්තා වූ මම බොහෝ දෙනාට දෙන දෙයක් තෝරා ලා එක් කෙනෙකුට ම දෙවන කලක් පරිද්දෙන් මා කෙරෙහි කළ කරුණාවෙන් එ තැනට වැඩි බුදුරන් දැක ඉදුරා සිතක් ඇති කෙනෙකුන් දක නො පහදින්ට බැරි හෙයින් සිත ඉදුරා පහදවා චිත්ත ප්‍රසාද නැමැති හිණින් දෙව් ලොවට නැංගෙමි'යි කිවු ය.

i. දේවතාවා බමුණා සමග කථා කිරීමේ අරමුණ කුමක් ද?
ii. බුදුරජාණන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් කෙරෙහි සිත් පහදවා ගැනීමේ ප්‍රතිඵල දෙකක් ලියන්න.
iii. "චිත්ත ප්‍රසදය අපට කැල ම පිහිට වන්නේ වේ දැය" මෙය ලිහිල් බසින් ලියන්න.
iv. 'අහෙතුක ප්‍රතිසන්ධික' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ආ ) එ කල කර්මාන්විත වූ ව්‍යාධියක් හැර අවශේෂ වූ ව්‍යාධි, එක ආලේප මාත්‍රයෙකින් අන්තර්ධාන වන තරම් දිව්‍යමය වූ ඖෂධ උගන්වන්නා වූ ශක්‍රයෝ ජීවකයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි වෛද්‍යශාස්ත්‍රය උගන්වා නිම වූහ. ශක්‍රයන්ගේ ආනුභාවයෙන් උගන්නා ශිල්පය කල් පමා කොට ලා ගියේ ද යත්? එසේ නැති, අනුන් සොළොස් අවුරුද්දකින් උගන්වන්නා වූ ශිල්පය ශක්‍රයෝ තමන්ගේ ආනුභාවයෙන් ජීවකයන් සත් අවුරුද්දකින් ඉගැන් වූහ. එකල ජීවකයෝ වෛද්‍යය තමන්ට නිමි සේ දැන ආචාරීන් කරා ගොස් "ස්වාමීනි! නුඹගේ මේ ශිල්පයෙහි නිමාවෙක් කවර කලෙක වේද" යි විචාළහ. ආචාරී "මොහුගේ ශක්ති පරීක්ෂා කෙරෙමි" යි සිතා "එසේ වී නම් පුත තෙපි මේ නුවර සතර වාසලින් පිටත් වලා, සතර දවසක් සතර යොදුනක් තැන් වෙන වෙන ම ඇවිද ඖෂධයකට නො ගත හැකි මුලක්-මලක්-පොත්තක්-අත්තක්-ඵලයක් පතක් සොයාගෙන අවුත් මට පෑ බලගැ" යි කීහ.

1 ජීවක වෛද්‍යවරයා ඉගෙනීම අවසන් කළ පසුව සුව කළ නොහැකි වූ ව්‍යාධියක් වී නම් එය කුමක්ද?

11 ගුරුවරයා ජීවකගේ දැනුම පරීක්ෂා කිරීමට ලබාදුන් අවසන් පරීක්ෂණය දක්වන්න.

111 "එක ආලේප මාත්‍රයෙකින් අන්තර්ධාන වන තරම් දිව්‍යමය වූ ඖෂධ" මෙය ලිහිල් බසින් ලියන්න.

1v 'කර්මාන්විත' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

ඉ) චුල්ල ධනුර්ධරයෝ තමන්ගේ බිරින්දෑ කැඳවා ගෙන මාවතෙක යන්නාහු වනාන්තරයකට පැමිණියහ. ඒ වනාන්තරයේ භයංකාර වූ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත. ඒ හස්තියා ධනුර්ධරයන් දැක දිව ගෙන ආ ය. චුල්ල ධනුර්ධරයෝ පඤ්චායුධ සන්නද්ධ ව ඊ දඩු පන්සියකුත් ඇරගෙන යන්නාහු හස්තියා දිව ගෙන එන්නා ඊ දණ්ඩක් ඇද පියා ඇරගෙන විද්දාහු වාත කුඹයෙන් වැද පලවා, ඇතා එතන ම එළා නික්මුණු කලට, අනික් වනාන්තරයක සොරුන් පන්සියයක්, දඩමස් පුලුස්සා කන කලට චුල්ල ධනුර්ධරයෝ එතැකට පැමිණ තමන් බිරින්දෑට කියනාහු "දඩමස් පුලුස්සා කන මිනිසුන් උන් තෙනට ගොස් දඩමස් ඉල්ලවා ගෙන එව" යි කියා යැවූහ. එකියන සොරු පිලිස්සූ දඩමස් නො දී අමු මාංශ දී යැවූහ. චුල්ල ධනුර්ධර කුමරයෝ අමු මාංශ දැක කියන්නාහු "පිලිස්සූ මාංශ නො දී අමු මාංශ දුන්නේ අප කෙරේ කනස්සලුවෙන් දැ" යි කියා දෙවැනිව බිරින්දෑ අත අමු මාංශ යවන්නා සොරු පන්සියය කෝප වන.

1 චුල්ල ධනුර්ධර හස්තියා පලවා හැරියේ කෙසේ ද?

11 අමු මාංශ දුටු කුමරා සිතන්නේ කුමක්ද?

111 “ඒ වනාන්තරයේ භයංකාර වූ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත.” මෙය ලිහිල් බසින් ලියන්න.

1v ‘වාත කුඹයෙන්’ යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඊ) එකල්හි රජ්ජුරුවෝ සීව නම් අමාත්‍යයකු කැඳව මාවටු පටුන්ගම ප්‍රධාන ව ඉද බඳු පඩුරු දෙන සේ සලස්වා සනුමාන දී නික්මවූහ. ඒ ගිය අමාත්‍යයා අතරමග සිට එපවත් කියා යවීය. එකල මාවටු පටුනෙ හි මනුෂයෝ වීථි හැම කළිකසළ හරවා අලංකාර කොට ධජපතාක නංවා දොරකඩක් පාසා පූර්ණඝට හා මාරුක්මලින් පූර්ණ කලස තබ්බවා මහ වේ දෙපස නිරිකුඩම් තනා වට වැටපහන් ලවා සියලු විථිමාර්ගය එකහෙළා සරහා තබා හැමදෙනම ඉදිරියට ගියහ. එකල අමාත්‍යයා ඉස් ශෝධා නහා සියලු වස්ත්‍රාභරණයෙන් සැරහී මුදුනෙහි වියන් බැඳ සුවඳ මල් දම් එල්වා සරහන ලද රථවාහයකට නැගී මග සෙනග පිරිවරා මාවටු ගමට වැද විථි සැරහීම් බල බලා නුවර ප්‍රදක්ෂිණා කොට නික්මුණු මහ රජෙකු සේ ගොසින් නන්දිය නම් වෙළෙදාණන්ගේ ප්‍රාසාද සමීපයට පැමිණියේ ය.

1 රජ්ජුරුවෝ සීව ඇමතිට පැවරූ කාර්යය කුමක් ද?

11 ගම ප්‍රධාන ඇමති පිළිගැනීමට වීථි සැරසූ ආකාරය දක්වන්න.

111 “බඳු පඩුරු දෙන සේ සලස්වා සනුමාන දී” මෙය ලිහිල් බසින් ලියන්න.

1v ‘නිරිකුඩම්’ යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(උ) බලමින් ලකුණු ගත
දුදන ගුණ දැක ඔහු සිත
නො වසව තෙපි ම වෙත
සිල්ප නො දෙමැයි කිවෙන් මහසත

වීණා සිප් සකස
නො හැර ම ඇදුරු උවදෙස
ඉගෙන ගෙන සිතු ලෙස
සිතී මූසිල ගඳඹ මේ ලෙස

1. සිල්ප නො දීමට හේතු වූ කාරණය කුමක් ද?

11. ශිෂ්‍යයා ඉගෙනීමේ දී අනුගමනය කළ යහපත් ගුණාංග දෙක කවරේ ද?

111. "ඉගෙන මූසිල ගෙන සිතු ලෙස

සිතී මූසිල ගදඹ මේ ලෙස"

මෙය ලිහිල් බසින් ලියන්න.

1v. ‘ඇදුරු උවදෙස’ යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඌ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඌ) පහත සදහන් උද්ධෘත අතුරින් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

1 "තොපි අතින් අපි බොහෝ කොට නොවිචාරම්හ"

11 "පළමුව දුටු කෙනෙක් තෙලෙ හැරගන්නේ ය"

111 "ස්වාමිනී, මෙසේ වූ උපද්‍රව ඇති තෙනින් අපට ප්‍රයුජන කිම් ද?"

1v "තාගේ දුවක් කුලවන්තයන් මිස සමාන ජාති ඇති පුරුෂයන් නො කැමත්තී ල"

v "ඕකට ගිය කෙනෙක් ආයෙ එන්නෙ නෑ. උඹ පලයන් ආපසු ගමට"

v1 "ඔබතුමා කියන්සේ ගැහැනු නම් පිළිකුල්ය"

v11 "අනේ, අම්මේ එහෙම දෙයක් නම් කරන්න ලැස්ති වෙන්න එපා."

(ලකුණු 04 යි.)

(එ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂය, භාෂාව හා ආකෘතිය කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

බලන විට අවට ලොවඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස
I
සුදු පතල හිම අතර නුහුරු නුපුරුදු ලොවකි
කොල හැළී ඇට සැකිලි ගස් පෙනේ ඒක දිගට
මට අරුම ලොවක් මැද නැගෙ යි තනිකම රුදුරු
මගේ ගම, මගේ බස, නෑසියන් නොම පෙනේ

මට ම දොස් පවරමින් මෙරට පිවිසීම ගැන
සිත සිතා උපන් රට ගැන නිබඳ දුක් වෙමින
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස
II
මහා සාගරය මැද කුඩා දිවයිනකි මෙය
ඇමරිකන් බලය මත දනන් තනි පොලඹවන
මැරුණු ගිනිකඳු අතර වියරු ගිනිකඳු තිබෙන
මට නොරිසි මෙදූවට පමිණියේ කුමකට ද?

මට පුරුදු සිප් කලා, කවි සිනා නොම ඇසෙන
තනිකමේ වෙළී ගෙගෙන හද පිරුණු දොම්නසින
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

III

සිරුර ගිනි ගත් විලස කලබලයෙන් දුව පනින
කාසිමලු සොයා සොයා දිවා රෑ වෙහෙස වන
දනන් පිරි මේ රටෙහි නිහඬ බව මරා ඇති
ජීවිතේ අරුත කිම දැයි අසමි මම මගෙන්

චීන බසමයි දිවා රෑ සවන් වැකෙන්නේ
මේ රටේ පාළුවක් දැනෙයි ඉවසිය නොහැකි
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

එදා මෙන් අදත් තනි නොතනියට ඔබ පමණ
කාලයේ දේසයේ රැහැන් බිඳ මවෙත එන

(ලකුණු 04 යි.)

2 "ප්‍රතිභා ශක්තියෙන් යුක්තව වර්ණනා කිරීම හා මනුෂ ජීවිතය පිළිබඳ මනා ජීවන දර්ශනයක් පිරිනැමීම හේතුවෙන් සද්ධර්ම රත්නාවලිය නවතාවයෙන් යුක්ත ය." නියමිත කතාවස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 04 යි.)

නැතහොත්

සජීවී අවස්ථා සිද්ධි නිරූපණය තුළින් මිනිස් සිතේ පවත්නා සංකීර්ණ ස්වරූපය විදහා පෑමට ජාතක කතාකරුවා සමත් ව ඇති අන්දම නියමිත කථා වස්තු දෙකක් ආශ්‍රයෙන් විමර්ශනයක යෙදෙන්න.

(ලකුණු 04 යි.)

3 (අ) දඹදෙණි හා ගම්පොල අවධිවල සිංහල ගද්‍ය සාහිත්‍යයේ වර්ධනයට දායක වූ ගද්‍යකරුවන් හා ග්‍රන්ත පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි.)

(ආ) සමාජයේ විවිධ තරාතිරම්වල පුද්ගල ක්‍රියාකාරකම්හි අනුසස් හා ආදීනව අනුව කුශලාකුශලකර්මයන්හි කුසලා කුසල ඵලවිපාක දෙන අයුරු සද්ධර්මාලංකාරයේ කථා වස්තු ආශ්‍රයෙන් විස්තර කරන්න.

නැතහොත්

"චරිතවල ජීවමාන ස්වරූපය පෙන්වා දීමත් උසස් ගතිගුණ ඉස්මතු කිරීමත් තුළින් මිනිස් ගුණ විවරණය කරන විශිෂ්ට ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ලෙස පූජාවලිය අගය කළ හැකිය." පූජාවලියෙහි කථාවස්තු ආශ්‍රයෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 04 යි.)

4 "අවස්ථෝචිත විරිත් භාවිතය හා උපමා රූපකාදී අලංකාරෝක්ති භාවිතය ගුත්තිලය රසවත් කාව්‍යයක් බවට පත්වීමට හේතු වී ඇත." විමර්ශනය කරන්න.

(ලකුණු 04 යි.)

5 නවකතාවක අවස්ථා සිද්ධි නිරූපණය පිළිබඳ නිරූපනය පිළිබඳ සාකච්ඡා කොට බැද්දේගම නවකතාවේ සාර්ථකත්වයට සජීවී අවස්ථා සිද්ධි නිරූපණය හේතුවන අයුරු නිදසුන් මගින් පහදන්න

(ලකුණු 04 යි.)

6 සිංහල කෙටිකතාවේ සංකේත නිරූපණය විස්තර කොට 'වෙසක් පහන' කෙටිකතාවේ අත්දැකීම ප්‍රබල ව නිරූපණයට සංකේත භාවිතය හේතු වූ ආකාරය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි.)

7 කොළඹ යුගයේ ද්විතීක තරංගයේ කවීන්ගේ නිර්මාණවල වස්තුවිෂය පිළිබඳ කෙටියෙන් හඳුන්වා භාෂාව භාවිතයේ දී දැක්වූ සුවිශේෂතා කවීන් තිදෙනකුගේ නිර්මාණය ඇසුරෙන් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 04 යි.)

8 සමාජ සම්මතයන් හා මානව චිත්තවේග අතර සට්ටනයට මුහුණ දෙමින් පුද්ගලයා සමාජයේ ජීවත් වන ආකාරය පෙමතෝ ජායතී සෝකෝ නාට්‍යායන් මනාව නිරූපණය වේ" නාට්‍ය පෙළ ඇසුරෙන් නිදසුන් සහිත ව පිරික්සන්න.

(ලකුණු 04 යි.)

***